# 08 සිව්වනක් පිරිස සපිරෙයි

## නන්ද කුමරු මංගල දිනයේ පැවිදිවෙයි

බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම කොට දෙවනි දවස උදාවිය. මහා ප්‍රජාපතී ගෝතමියගේ පුත් වූ උන්වහන්සේගේ සොහොයුරු නන්දකුමරුගේ ආවාහය, රාජාභිෂේකය සහ ගෙට ගෙවැදීම යන මංගල අවස්ථා තුන ම එදිනට යෙදී තිබිණි. උන්වහන්සේ මහ සඟන පිරිවරා රජගෙට වැඩම කළ සේක. රජතුමා ඇතුළු පිරිස ප්‍රණීත භෝජනයෙන් උන්වහන්සේලා වැළඳවූහ. බුදුරජාණන් වහන්සේ දන් වළඳා අනතුරුව අනුමෙවෙනි බණ වදාරා රජගෙදරින් පිටත් වෙද්දී තම පාත්‍රය නන්ද කුමරු අතට දුන් සේක. කුමාරයා ද කීකරුව පාත්‍රය රැගෙන උන්වහන්සේ පසුපස ගියේ ය.

විවාහ ගිවිසගෙන සිටි ජනපද කළ්‍යාණියගේ මැදුර තිබුණේ ද ඒ මග අසල ය. කුමරු බුදුරදුන් පසුපස යනු සඳළුතලයේ සිට බලා සිටි ජනපද කළ්‍යාණිය කුමරුට අත වනා ඉක්මනින් ආපසු එන්-නැයි කිවාය. කුමරු ඒ වදන් සිත තබාගෙන ම නිහඬව ගමන් කළේ ය.

ඔහු දැන් යන්නේ ''බුදුහාමුදුරුවන් පාත්‍රය දැන් ගනී, දැන් ගනී" යැයි සිතමිනි. එහෙත් බුදුරජාණන් වහන්සේ විහාරයට වඩින තුරු ම පාත්‍රය නොගත් සේක. විහාරය තුළ දී පාත්‍රය අතට ගත් බුදුරජාණන් වහන්සේ, ''නන්ද ඔබ පැවිදි වෙන්න කැමැති දැ'' යි ඇසූහ.

ජනපද කළ්‍යාණියගේ වදන්, ආවාහය, රජ පදවිය, ගෙවදීම යන සුවිශේෂී කරුණුත් බුදුරජාණන් වහන්සේගේ යෝජනාවත් මැද කුමාරයා අතරමං විය. එහෙත් බුදු වදනට පිටුපෑමට නොහැකි වූ හෙතෙම හිස සළා අකමැත්තෙන් වුවද කැමති බව හැඟවීය. බුදුරජාණන් වහන්සේ නන්ද කුමරු පැවිදි කරවූ හ. ගතින් පැවිදි වූවත් සිතින් උන්වහන්සේ සිටියේ ජනපද කළ්‍යාණිය වෙත ය. උන්වහන්සේගේ සිත වෙනස් කිරීමට බුදුරජාණන්

වහන්සේ කළේ අපූරු උපක්‍රමයකි. ඍද්ධිබලයෙන් නන්ද තෙරුන් දෙව්ලොවට කැඳවාගෙන ගොස් එහි දී දෙවඟනන් පෙන්වා ජනපද කල්‍යාණිය පිළිබඳ සිත වෙනස් කළහ. පසුව නන්ද තෙරණුවෝ ඒ අදහස් අත්හැර හොඳින් මහණදම් කොට රහත් බවට පත්වූහ.

## රාහුල කුමරුටත් පිය උරුමය හිමි වෙයි

බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් නුවර වැඩම කොට සත්වන දවස එළඹිණි. විසිදහසක් රහතුන් පිරිවරාගෙන මහ මග පිඬු සිඟා වඩින බුදුරජාණන් වහන්සේ සඳළුතලයේ සිටි යශෝධරාවට පෙනිණි. මෙතෙක් තම පියා නොදුටු සත් හැවිරිදි රාහුල කුමරුට ඈත වඩින බුදුරදුන් පෙන්වා ඇය මෙසේ පවසන්නට වූවාය.

> චක්කවරංකිත රත්ත සුපාදො - ලක්ඛණ මණ්ඩිත ආයත පණ්හි
> චාමර ඡත්ත විභූසිත පාදො - එස හි තුය්හ පිතා නරසීහො

'' උතුම් වූ චක්‍ර ලක්‍ෂණයන් ගෙන් යුතු, රතු පැහැ, සිරිපා යුවලක් ඇති, දිගු විළුම් ඇති, සෙමෙර සේසත් ආදී මඞ්ගල ලක්‍ෂණයන්ගෙන් ශෝභමාන වූ, සිරිපා ඇති අර එන නරශ්‍රේෂ්ඨයා ඔබේ පියාණන් වහන්සේ යි ''



මෙසේ නරසීහ ගාථා අටකින් පියාගේ අසිරිය ඉගැන්වූ යශෝධරාව, සිය පුතණුවන් දායාදය ඉල්ලාගෙන එන්නැයි මාලිගය අසලින් වඩින බුදුරදුන් වෙත පිටත්කර හැරියා ය. පුංචි කුමාරයා ද වහා දිවගොස් '' බුදුපියාණන් වහන්ස, ඔබගේ සෙවණත් මට සැපයැ යි'' සුරතල් බස් දොඩමින් උන්වහන්සේගේ සිවුරු කොණක එල්ලී පසුපසින් ම ගියේ ය. මෙසේ යන අතර පියාණෙනි, මට ඔබේ දායදය දෙනු මැනැවැයි '' ද කීය. උන් වහන්සේ විහාරය දක්වා ම නිහඬ ව වැඩම කළහ. එහි දී සැරියුත් තෙරුන් අමතා ''ශාරිපුත්‍රය, මේ දරුවා මගෙන් දායාද ඉල්ලයි, මට ඇති එක ම දායාදය සසර දුකින් මිදෙන පැවිදි බව යි. එය මේ දරුවාට දෙන්නැයි'' වදාළහ. සැරියුත් මහරහතන් වහන්සේ රාහුල කුමාරයා පැවිදි කළහ.

මේ පුවත සුදොවුන් රජුගේ කණ වැකිණි. තමාට තිබුණු එක ම සැනසිල්ලත් අහිමිවීමේ දුක එතුමාට වාවාගත නොහැකි විය. ඔහු විහාරයට ගියේ දිවගෙන ය. වැඳ එකත් පසෙක සිටි රජතුමා

> '' ස්වාමීනි, දරු දුක කියන්නේ මහ පුදුම දෙයක්. එය මේ සිවිය සිඳ, හමටත්, සම සිඳ මස්වලටත්, මස් සිඳ නහර වලටත්, නහර සිඳ ඇටවලටත්, එතැනින් ඇටමිදුළු දක්වාත් ගමන් කරන්නක්. ස්වාමීනි, මම ඔබ වහන්සේ ගිහිගෙය හැරදා ගිය පසු නන්දකුමරු හා රාහුල කුමරු ගැන සිතා හිත හදා ගත්තා. ඔබ වහන්සේ නන්ද කුමාරයා මහණ කළා. ඊළඟට රාහුල පුතු ඉන්න නිසා හිත හදා ගත්තා. දැන් ඔහුත් මට අහිමි වුණා. ස්වාමීනි, මට වූ මේ දුක වෙනත් කිසිම මව් කෙනෙකුට පිය කෙනෙකුට නොවේවායි මා පතනවා. ඒ නිසා මට එක වරයක් දෙනු මැනවි. මින් මතු මව්පියන්ගේ අවසරය නොමැතිව කිසි කෙනෙකු පැවිදි නොකරනු මැනැවැයි '' ඉල්ලා සිටියේ ය.

බුදුරජාණන් වහන්සේ මෙම ඉල්ලීම පිළිගත්හ. භික්ෂූන් වහන්සේ අමතා මෙතැන් පටන් මව්පියන්ගේ අවසරයක් නොමැති ව දරුවන් පැවිදි නොකරන්නැ'යි වදාරා ඒ පිළිබඳ විනය නීතියක් ද පැණවූ සේක.

## දෙව්දත් කුමරුත් සසුනට පිවිසෙයි

නන්ද කුමරු පැවිදි වූ තැන් සිට ශාක්‍ය තරුණයෝ බොහෝ දෙනා පැමිණ බුදු සුසුනේ පැවිදි වූහ. එහෙත් භද්දිය, අනුරුද්ධ, ආනන්ද, භගු, කිම්බිල, දේවදත්ත යන ප්‍රධාන පෙළේ ශාක්‍ය කුමාරයන් හයදෙනා තව ම පැවිදි වී නැත. ඔවුන්ගේ දෙමාපියෝ පවා මොවුන් පැවිදි නොවන්නේ බුදුරදුන්ගේ නෑදැයන් නොවන නිසා දැයි දොස් කියන්නට වූහ. අන්තිමේ දී ඔවුහු සයදෙනා උපාලි කරණවෑමියා ද සමග බුදුරදුන් සොයා ගියහ. ඒ වන විට උන්වහන්සේ වැඩ සිටියේ මල්ල රට අනෝමා ගංතෙර අනුපිය අඹ වනයෙහි ය. පිරිවර ආපසු යවා එහි ගිය ඔවුහු බුදුරදුන් වෙතින් පැවිද්ද ඉල්ලා සිටියහ. එසේ ම තම මානය නැති වනු පිණිස උපාලි නම් කරණවෑමියා පළමු ව පැවිදි කරන ලෙස ද කුමාරවරු ඉල්ලා සිටියහ. බුදුරජාණන් වහන්සේ එසේ කළහ. පසු කාලයේ දී විනයධර භික්ෂූන් අතර අගතැන් ගත්තේත්, ප්‍රථම සංගායනාවේ දී විනය දේශනා කළේත් මේ උපාලි තෙරුන් ය.

බුදුරදුන්ගේ පිය පරපුරේ ශාක්‍ය දේශයත්, මව් පරපුරේ කෝලිය දේශයත් පැවතුනේ රෝහිණී ගඟ දෙපස ය. එහි කුඹුරුවලට ජලය බෙදා ගැනීමේ දී ගොවියන් අතර ඇතිවූ ගැටුමක් අන්තිමේ දි රාජ්‍ය දෙක අතර යුද්ධයක් බවට පත්විය. තම නෑ දෙපිරිස යුදයෙන් වැනසෙන්නට යනු දුටු බුදුරජාණන් වහන්සේ යුද පිටියට වැඩම කොට අහස්කුස සිට සම්මෝදමාන ජාතකය ආදී ජාතක කතාවලින් සමගියේ අගය වදාරා ඔවුන් සමගි කළහ. බුදුරදුන් කිඹුල්වත් නුවර වැඩ සිටින අතරතුර දී මහා ප්‍රජාපතී ගෝතමිය ඇතුළු කාන්තාවෝ පැවිදි වන්නට දෙවරක් ම අවසර ඉල්ලා සිටියහ. එහෙත් ඊට ඉඩ නොලැබිණි.

## කාන්තාවෝ පැවිද්ද දිනා ගනිති

බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් නුවරින් විශාලා මහනුවර බලා වැඩම කළහ. පැවිදිවීමේ අදහස අත් නොහළ මහා ප්‍රජාපති ගෝතමිය ඇතුළු පන්සියක් ශාක්‍ය කාන්තාවෝ හිස මුඩුකොට කසාවත් හැඳ පාගමනින් ම විශාලා මහනුවර බලා පිටත් වූහ. ඔවුහු විශාලා මහනුවරට පැමිණ එහි කූටාගාර ශාලාවේ ලැගුම් ගත්හ. කිසිදා මෙතරම් දුර පාගමනින්

නොගිය මේ සියුමැලි කාන්තාවන්ට එය ඉතා දුෂ්කර ගමනක් විය. ඩහදියෙන් සිරුර තෙමී, දූවිල්ලෙන් නැහැවී සිටියහ. සමහරුන්ගේ පතුල් පැලී ලේ ගැලී තිබුණි. බුදුරදුන්ගේ සුළු මව ඇතුළු මේ කාන්තාවන් විඳින පීඩාවත් ඔවුන්ගේ නොපසුබස්නා උත්සහායත් දුටු අනඳ තෙරණුවෝ නොපමාව ඔවුන්ගේ ඉල්ලීම බුදුරදුන්ට ඉදිරිපත් කළහ. එහෙත් බුදුරජාණන් වහන්සේ අනඳ හිමියන්ගේ ඉල්ලීම ද දෙවරක් ම ප්‍රතික්ෂේප කළහ.

ආනන්ද හාමුදුරුවන් නැවත බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ කාන්තාවන් වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරමින් '' ස්වාමිනි, භාග්‍යවතුන් වහන්ස, කාන්තාවකට මෙම සසුනෙහි පැවිදිව සතර මඟ පල පසක් කරන්නට නොහැකි වේ දැ''යි විමසූහ. බුදුරජාණන් වහන්සේ කාන්තාවට හැකි බව වදාළහ. '' ස්වාමිනි, එසේ නම් මේ මහා ප්‍රජාපතී ගෝතමිය ඔබ වහන්සේට ඉතා උපකාරී වූවා ය. සුළු මව ය. ඔබ වහන්සේගේ අත්පා වැඩුවා ය. පෝෂණය කළා ය. මෑණියන් කළුරිය කළ පසු ඔබ වහන්සේට කිරි පෙව්වා ය. ස්වාමීනි එවන් කාන්තාවන් මේ සාසනයෙහි පැවිද්ද ලබන්නේ නම් මැනවැ යි '' ආනන්ද හිමියෝ පැවසූහ. ආනන්ද හිමියන්ගේ අදහසට එකඟ වූ බුදුරජාණන් වහන්සේ ගරු ධර්ම නමින් නීති අටක් පණවා "මේවා පිළිගන්නේ නම් එයින් ම ඔවුන්ට පැවිද්ද හා උපසම්පදාව ලැබෙන්නේ යැ"යි වදාළහ.

මහා ප්‍රජාපතී ගෝතමිය ඇතුලු පිරිස ඒ ගරු ධර්ම අට හිස මුදුණින් පිළිගත් හ. එයින් ඔවුහු සසුනේ පැවිදි උපසම්පදාවට හිමිකාරියෝ වූහ. මේ ආකාරයෙන් බුදු සසුනේ මෙහෙණි සස්න ඇරැඹිණි.

ඒ අනුව භික්ෂුණී සාසනයේ පළමු භික්ෂුණීන් වහන්සේ ලෙසින් මහා ප්‍රජාපතී ගෝතමිය පැවිද්ද ලැබුවා ය. පසුව ඇය රහත් බව ලබා චිරාත්‍රඥ භික්ෂුණීන් අතර අග තනතුර ද ලැබුවා ය. ඇය සමග යසෝදරා දේවිය ඇතුළු ශාක්‍ය කුමාරිකාවෝ පන්සියයක් මෙහෙණි සස්න ඇරඹීමට දයක වූහ.

මෙසේ ආරම්භ වූ භික්ෂුණී සාසනය තුළ බොහෝ කාන්තාවන් ඇවිත් පැවිදි වූ අතර ඔවුහු මාර්ගඵල ලැබීමටත් සමත් වූහ. මේ නිසා ම භික්ෂුන් වහන්සේලාට මෙන් ම භික්ෂුණීන් වහන්සේලාටත් අගතනතුරු ලැබිණි.

භික්ෂුණී පිරිස වැඩි වන විට අර්බුද වැඩි වූ නිසා ඔවුන් හික්මවීම පිණිස භික්ෂුණී ප්‍රාතිමෝක්ෂයක් ද පණවන ලදී.

### අභ්‍යාස

01. නරසීහ ගාථා සොයා වනපොත් කරන්න.

02. අෂ්ට ගරුධර්ම සොයා ඔබේ අභ්‍යාස පොතේ ඔබේ බසින් පිටපත් කරන්න.

03. දෙව්දත් හිමි සමග පැවිදි වූ අයගේ නම් මොනවා ද?